

# අපගේ පියාණන් වන දෙවියන්වහන්සේ

- මාර්ක් ඩ්‍රැබන්ස්ටොට් විසිනි -

**God Our Father**

# අපගේ පියාණන් වන දෙවියන්වහන්සේ

- මාර්ක් ඩ්‍රැබන්ස්ටොට් විසිනි -

# පටුන


| | |
|---|---|
| හැඳින්වීම | 3 |
| බයිබලයේ දෙවියන්වහන්සේ ගැන එළිදරව් | 3 |
| අපගේ ස්වර්ගීය පියාණන් කවුරුන්ද? | 7 |
| කන්ද උඩ දේශනාවෙන් පාඩම් | 9 |
| "දරුවන්" ඡේදවලින් පාඩම් | 10 |
| යොහාන්ගේ පොතෙන් පාඩම් | 11 |
| අප පියාණන්ගේ දරුවන් වන්නේ කෙසේද? | 12 |
| යොහන් 3හි පාඩම් | 13 |
| යොහන් 3:16 යේ සුභාරංචි සංක්ෂිප්තයක් | 15 |
| අපොස්තුලුවර පාවුල්ගේ ලේඛනවලින් පාඩම් | 17 |
| අවසානය | 18 |
| ප්‍රශ්න | 20 |

# අපගේ පියාණන් වන දෙවියන්වහන්සේ

- මාර්ක් බ්‍රැබන්ස්ටොට් විසිනි -

## හැඳින්වීම

### "පටන්ගැන්මේදී දෙවියන්වහන්සේ අහසත් පොළවත් මැව් සේක." (උත්පත්ති 1:1)

මෙම කෙටි වචන ස්වල්පයෙන් බයිබලය අප දෙවියන්වහන්සේට හඳුන්වා දෙයි. බයිබලයේ දෙවියන්වහන්සේ මැවුම්කරු බවත්, - පොළවෙහිත් ස්වර්ගයෙහිත් නිර්මාතෘ, ජීවය දෙන්නාත්, යහපත දෙන්නාත් බැව් අපි ඉගෙන ගනිමු. නමුත් දෙවියන්වහන්සේ මැවුම්කරුවෙකුට වඩා වැඩි බැව් බයිබලය පෙන්වයි. උන්වහන්සේ අපේ ස්වර්ගීය පියාණෝය.

අප උන්වහන්සේගේ දරුවන් වීම දෙවියන්වහන්සේට උවමනාය. අපගේ ස්වර්ගීය පියාණන් වීමට උන්වහන්සේට උවමනාය. ඇත්තවශයෙන්, මෙය බයිබලයේ බලවත්ම පණිවිඩවලින් එකක්ය. අප උන්වහන්සේගේ විශේෂිත පවුලේ කොටසක් කිරීමට උවමනාය, නමුත් එය ස්වයංක්‍රියව සිදුනොවේ. උන්වහන්සේ නියම කරන ලද විශේෂ මාර්ගයෙන් අපි උන්වහන්සේගේ පවුලට ඇතුල් විය යුතුවෙමු. එම මාර්ගය මෙම වචනවල සම්පිණ්ඩනය කර ඇත.

> "නමුත් යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද, එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහත්තෝද, ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන්වෙන්ට උන්වහන්සේ බලය දුන් සේක. ඔවුහු ලෙයෙන්වත් මාංසයේ කැමැත්තෙන්වත් මනුෂ්‍යයාගේ කැමැත්තෙන්වත් නොව දෙවියන් වහන්සේගෙන් උපන්නෝය."
> (යොහන් 1:12-13)

මෙම පොත් පිංචෙහි අපගේ පියාණන්වූ දෙවියන්වහන්සේ ගැනත්, අප උන්වහන්සේගේ වන්නේ කෙසේදැයි කියාත් උගනිමු.

## බයිබලයේ දෙවියන්වහන්සේ ගැන එළිදරව්

දෙවියන්වහන්සේ අප හට එළිදරව්වූ ආකාරය ගැන වාර්තාවක් බයිබලය අපට සපයයි. යුගයන් තුළදී, බොහෝ මාර්ග තුළින්

දෙවියන්වහන්සේ තමන්වහන්සේ එළිදරව් කර ඇත. උන්වහන්සේ එකම දෙවියන්වහන්සේය. නමුත් කාලයන් තුළදී උන්වහන්සේ තමන්වහන්සේ ගැන තවත් දේ අපට පවසා ඇත. එක් අර්ථයකින් බයිබලය, එම එළිදරව්වල දිගුකරන ලද වාර්තාවකි.

පෘථිවිය සාදා බොහෝ කලකට පසු දෙවියන්වහන්සේ, පසුව ආබ්‍රහම් යැයි නම් කල මිනිසෙකුට දර්ශනය වී, පුදුම සහගත ලෙස පෙණුනු පොරොන්දු ප්‍රකාශ කලසේක. (උත්පත්ති 12 දී මෙම පොරොන්දුවල පළමුවැන්න වාර්තාවී ඇත.) නමුත් ආබ්‍රහම් දෙවියන්වහන්සේ අදහා, බොහෝ ඈත ඔහු නොදන්නා දේශයකට ගියේය. තමන් මහත් ජාතියක් ස්ථාපිත කරණ බවත් සදාකාල ජීවිතය සමඟ විශිෂ්ට උරුමයක් ලබන බවත් දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට පොරොන්දු වූ සේක. මේ සියල්ලටම පසු උන්වහන්සේ මහත්ම පොරොන්දුව දුන්සේක. "නුඹටද.... දෙවියන්වහන්සේ වන පිණිස" (උත්පත්ති 17:7) මෙම පොරොන්දුව කරමින්, මැවුම්කරුවාණෝ ආබ්‍රහම්ගේ දෙවියන්වහන්සේද, ඊසාක්ගේ දෙවියන්වහන්සේද, යාකොබ්ගේ දෙවියන්වහන්සේද වූ සේක. උන්වහන්සේ යාකොබ්ගේ පැවතෙන්නාවූ ඉශ්‍රායලයේ දෙවියන්වහන්සේ වූ සේක.

වසර හාරසියකට පමණ පසු, ආබ්‍රහම්ගෙන් පැවතෙන්නෝ දෙවියන්වහන්සේගේ ජාතිය ලෙස නොපෙනුනු අතර ඔවුහු මිසරයේ වහල්ලු වූහ. නමුත් දෙවියන්වහන්සේට තම ජනතාව අමතක වී නොතිබුනි. දෙවියන්වහන්සේ තවත් විශේෂ පුද්ගලයෙකුට - මෝසෙස්ට දර්ශනය වූ සේක. තමාට මහත් මෙහෙයුමක් නිම කිරීමට ඇති බැව් දෙවියන්වහන්සේ මොසෙස්ට පැවසූ සේක. දෙවියන්වහන්සේගේ සෙනඟ වහල් භාවයෙන් මුදවීම මෝසෙස්ට නියම විය. මෙම ක්‍රියාව ආරම්භ කිරීමට පෙර දැනගත යුතුවූ ප්‍රශ්නය මෝසෙස් ඇසීය.

**" ඔබවහන්සේ කවුද? "**

බලවත් කටහඬක් පිළිතුරු දුනි.

**"මම යම්සේ සිටිම්ද එසේම සිටිමි ........ ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කථාකොට, ස්වයම්භූ නම් තැනන්වහන්සේ නුඹලා වෙතට මා එවූ සේකැයි කියාපන්න." (නික්මයාම 3:14)**

දෙවියන්වහන්සේ තමන්වහන්සේ "යහ්වෙහ්" ලෙස එළිදරව් කළ සේක. "සිටින ලද තැනැත්තා සිටින තැනැත්තා සහ සිටීමට ඇති තැනැත්තා" යන තේරුම් ඇති හෙබ්‍රෙව් නාමයක් (එළිදරව් 1:8 සසඳන්න.)

මෝසෙස්ට සහ ඊශ්‍රායෙල් ජාතියට, තමන්වහන්සේ බලයේ සහ මිඳවීමේ දෙවිකෙනෙක් බැව් බලසම්පන්න ශක්තිය විහිදා ජාතිය මිසරයේ වහල්භාවයෙන් පිටතට යොමුකරමින් පෙන්වීය.

වසර 500 කින් පමණ පසු, සියවස් ගණනාවකට සමාන නොවන දිවැසිවරයෙකු වන්නට වූ එලිජා හට ස්වාමීන්වහන්සේ දර්ශනය විය. එක් අවස්ථාවකදී එලිජා බිය වී, දෙවියන්වහන්සේගේ කන්දවූ හොරොබ් කන්දට පැන ගියේය. (විස්තරය 1 රාජාවලිය 19 දී ඇත.) එතැනදී ස්වාමීන්වහන්සේ ඔහු ගුහාවක මුඛයට කැඳවා, පර්වත කඩාදමන බලවත් සුළඟක්සේ තමන්වහන්සේ එළිදරව් කළ සේක. නමුත් දෙවියන්වහන්සේ සුළඟේ සිටියේ නැත. ඉන් පසු උන්වහන්සේ මේඝගර්ජනාත්මක භූමිකම්පාවකින් තමන්වහන්සේ එළිදරව් කළ සේක. නමුත් දෙවියන්වහන්සේ භූමිකම්පාවේ නොසිටියහ. උන්වහන්සේ කුරිරු ගින්නකින් තමන්වහන්සේ එළිදරව් කළ සේක. නමුත් දෙවියන්වහන්සේ ගින්න තුළ නොසිටියහ. සියල්ල අවසනායේදී දෙවියන්වහන්සේ "සියුම් නිශ්චලතාවයේ" හඬකින් කථා කළ සේක.

දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට, මෝසෙස්ට සහ එලිජා හට ප්‍රකාශ වූ ආකාරය ගැන අපට පරණ ගිවිසුමේ කියවිය හැක. මෙම බයිබල් වර්ණනා තුළ දෙවියන්වහන්සේගේ විශිෂ්ට, මනස්සෘෂ්ටික චිත්‍ර ඇතුලත්ය. නමුත් ඒවා පවුකාර ජනතාවකගෙන් ඉතා ඈත්වූ දෙවිකෙනෙක් ගැනත් එළිදරව් කරත්. මේ උසස් බොහෝසේ ඈත් වූ සහ සමීපවීමට නොහැකිතරම් දෙවිකෙනෙකි. ඔවුන් දෙවියන්වහන්සේ එළිදරව් වීම දුටු විට, එම දර්ශනය කෙතරම් බියකරු විද යත්, ආබ්‍රහම් පොළව මත දැඩි නින්දකින් පහත් විය, මෝසෙස් තම මුහුණ සඟවාගත් අතර එලිජා තම කබායෙන් මුහුණ වසා ගත්තේය. දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ ජනතාවගෙන් කොතරම් ඈත්ව සිටියාද යත්, එකම මිනිසෙකු පමණක්, උත්තම පූජකයා හට ස්වාමීන්වහන්සේගේ අති ශුද්ධවූ ස්ථානයට වසරට එක් වරක් පමණක් පැමිණි හැකි විය.

නමුත් එලිජා හට උන්වහන්සේගේ එළදරව් වීමේදී විශේෂිත වචන තිබුණි. ස්වාමීන්වහන්සේගේ පූර්ණ එළිදරව් වීමේ කාලය දෙසට යොමුවූ සියුම් නිශ්චලතාවයේ වචනයය.

තවත් වසර 900කට පමණ පසු එම කටහඬ නැවත ජීවමාන විය. බෙත්ලෙහෙම් නම් ගමක දෙවියන්වහන්සේගේ පුත්‍රයාවූ යේසුස් නම් මනුෂ්‍යයෙක් උපන්හ. මෙම යේසුස් පැමිණියේ අති විශේෂ අභිප්‍රායක සමඟය. කිසිවෙකු කිසිදිනෙක නොකළ ලෙස දෙවියන්වහන්සේ එළිදරව්

කිරීමටය. අප ඇත්තවශයෙන්ම උන්වහන්සේ ගැන දැන ගැනීමට උන්වහන්සේ කැමතිවූවා සේ දෙවියන්වහන්සේ එළිදරව් කිරීමටය. දෙවියන්වහන්සේ පියාණන් ලෙස එළිදරව් කිරීමටය. පියාණන් එළිදරව් කිරීමට පුත්‍රයෙක් අවශ්‍යය විය.

යේසුස්වහන්සේගේ ජීවිතයේ මහත් වැදගත් කාර්යයන්ගෙන් එකක් වූයේ අපගේ ස්වර්ගීය පියාණන් ලෙස දෙවියන්වහන්සේ එළිදරව් කිරීමයි. අපොස්තුලුවර යොහන් තම සුභාරංචි වාර්තාවට ලියූ ප්‍රස්ථාවනාවේ මෙසේ පවසයි.

> **"තවද වාක්‍යානෝ මාංසමත්ව, කරුණාවෙන්ද සත්‍යයෙන්ද පූර්ණව, අප අතරෙහි වාසය කල සේක. පියාණන්වහන්සේ වෙතින්වූ, ඒකජාතක පුත්‍රයාණන් වහන්සේගේ මහිමය වැනි උන්වහන්සේගේ මහිමය දුටිමුව" (යොහන් 1:14)**

යේසුස්වහන්සේම පසුව කියන පරිදි, "මා දුටු තැනැත්තේ පියාණන්වහන්සේ දුටුවේය." (යොහන් 14:9) "තාත්තාගේ පුත්" යන ජනප්‍රිය වැකිකඩ යේසුස්වහන්සේ ඔළුවෙන් සිටෙවුවාසේය. මෙතැනදී, කිසිවෙකු කිසිදිනෙක දෙවියන්වහන්සේ දැක නැත. නමුත් දැන් ඔවුන් උන්වහන්සේගේ පුත්‍රයා දුටු අතර, පියාණන්වහන්සේගේ විශිෂ්ට චරිතයේ සියලු දෑ යේසුස්වහන්සේ දැකීමෙන් ඔවුනට දැකීමට හැකි විය.

ආබ්‍රහම්ට, මෝසෙස්ට සහ එලිජාට ප්‍රකාශවූ දෙවියන්වහන්සේ දැන් වඩාත් පැහැදිලිව ප්‍රකාශ විය. යේසුස් නම් පුත්‍රයාගේ පියා ලෙස පමණක් නොව පියාණන්වහන්සේ ලෙසය. ස්වාමීන්වහන්සේගේ යාච්ඤාවේදී, දෙවියන්වහන්සේ සමීපයට ළඟාවෙන මිනිසුන්ට, ඇතිවූ බිය යේසුස්වහන්සේ නිට්ඨාවටම දුරු කළ සේක.

> **"ස්වර්ගයෙහි වැඩ සිටින අපගේ පියාණෙනි ඔබගේ නාමයට ගෞරව වේවා." (මතෙව් 6:9)**

දෙවියන්වහන්සේ පුත්‍රයාණනගේ පියාණෝය. නමුත් විශ්මජනක ලෙස, ඇදහිය නොහැකි ලෙස උන්වහන්සේ අපගේත් පියාණෝය. සැබැවින්ම, යේසුස්වහන්සේගේ මෙහෙය වූයේ පියාණන් ලෙස දෙවියන්වහන්සේ ප්‍රකාශ කිරීම පමණක් නොව අපට , ඔබට සහ මට, උන්වහන්සේගේ දරුවෙක් වීමේ ක්‍රමය පෙන්වීමටත් විය.

අපගේ ස්වර්ගීය පියාණෝ කවුද? අප පියාණන් වහන්සේගේ දරුවන් වන්නේ කෙසේද? අප උන්වහන්සේගේ දරුවන් නම්, අප ජීවත් විය යුත්තේ කෙසේද? පසු පැමිණෙන කොටස් වල අප පිළිතුරු දෙන්නේ මෙම ප්‍රශ්න වලටය.

## අපගේ ස්වර්ගීය පියාණන් කවුරුන්ද?

දෙවියන්වහන්සේ අපගේ පියාණන් නම් වූ විෂයය ප්‍රධාන වශයෙන් අලුත් ගිවිසුම තුළ සංවර්ධනය වූවකි. මෙයට හේතුව සරලය. පියාණන් එළිදරව් කිරීමට දෙවියන් වහන්සේගේ පුත්‍රයාවූ යේසුස්වහන්සේ අවශ්‍යය විය. කෙසේ නමුත්, දෙවියන්වහන්සේ පියාණන් යන තේමාව පැරණි ගිවිසුමේද දුටුව හැක. එහි "පියාණන්" යන තේමාවේ දෝංකාරය අපට හමුවේ. උදාහරණයක් ලෙස 2 සාමුවෙල් 7 හි, ඊශ්‍රායලයේ මහත් රජවරුන්ගෙන් කෙනෙකුවූ දාවිත්ට දෙන ලද මේ පෙරොන්දුව කියවමු.

> **"ඔහුම මාගේ නාමයට ගෘහයක් ගොඩනගන්නේය, ඔහුගේ රජකමේ සිංහාසනයද සදාකාලේටම ස්ථිර කරන්නෙමි. මම ඔහුට පියා වන්නෙමි. ඔහු මට පුත්‍රයා වන්නේය." (13-14 පද)**

ක්‍රි. පූ. 1000 දී පමණ ලියන ලදුව මෙය දෙවියන් වහන්සේගේ පුත්‍රයාද වීමට සිටි මහත් රජකෙනෙකු ගැන වූ අනාවැකියක් විය. නව ගිවිසුමේ ලූක් 2 පරිච්ඡේදයේ වාර්තාවූ පරිදි, මෙම අනාවැකිය යේසුස් වහන්සේගේ උත්පත්තියෙන් සම්පූර්ණ විය.

පියාණන් ලෙස දෙවියන්වහන්සේ හැඳින්වූ තවත් අවස්ථාවක් නම් ගීතාවලිය 103 යි. මෙය පැහැදිලිවම දෙවියන්වහන්සේ පොදුවේ පියාණන් ලෙස හැඳින්වූ අවස්ථාවයකි.

> **" පියෙක් තම දරුවන්ට අනුකම්පා කරන්නාක් මෙන් ස්වාමීන්වහන්සේ තමන් කෙරෙහි භය ඇත්තන්ට අනුකම්පා කරණ සේක. මක්නිසාද උන්වහන්සේ අපේ ස්වභාවය දන්නා සේක. අප ධූලි බව උන්වහන්සේ සිහිකරණ සේක." (ගීතාවලිය 103:13-14)**

භාෂාවේ රූපකරයක් ලෙස දෙවියන්වහන්සේ පියකෙනෙකුට සමාන කළද, උන්වහන්සේ "පියාණන්" ලෙස සාමාන්‍යයෙන් ආමන්ත්‍රණය නොකෙරේ. ආබ්‍රහම්, මෝසෙස්, එලියා සහ පැරණි ගිවිසුමේ තව බොහෝ අය සඳහා දෙවියන් වහන්සේ ප්‍රකාශ වූයේ බලයෙන් සහ මහිමයෙන් මිස, සැමවිටම පියාණන් ලෙස නොවේ. අපගේ දෙවියන්වහන්සේ ගැන අපගේ තේරුම් ගැනීම වඩා සම්පූර්ණ වෙයි.

තමන්වහන්සේ පරිසමාප්තියෙන්ම තම පියාණන් සේ නිසා, යේසුස්වහන්සේට පියාණන් එළිදරව් කළ හැකිවිය. හෙබ්‍රෙව් පළමුවැනි පරිච්ඡේදයේ මෙසේ අපට පවසයි :

"දෙවියන්වහන්සේ ආදි කාලයෙහි බොහෝ කොටස්වලින්ද බොහෝ අන්දම් වලින්ද ප්‍රොපේතවරුන් ලවා පියවරුන්ට කථා කරවා මේ දවස් වල කෙළවරදී තමන්වහන්සේගේ පුත්‍රයාණන් ලවා අපට කථා කල සේක. .................. උන්වහන්සේ දෙවියන් වහන්සේගේ මහත්තත්වයේ ප්‍රභාවද උන්වහන්සේගේ දේවත්වයේ සවරූපයද වන සේක." (හේබ්‍රෙව් 1:1-3)

මෙය වැදගත් පදයක් වනුයේ එය, යේසුස්වහන්සේත්, උන්වහන්සේගේ පියාණන්වහන්සේත් දැනගන්නා ආකාරය අපට උගන්වන බැවිනි.

"ස්වරූපය" නමැති වචනය "කරක්ටර්" නමැති ග්‍රීක වචනයේ පරිවර්තනයකි. ග්‍රීක ශබ්දකෝෂයක් පෙන්වන පරිදි මෙය, කැටයම් කොටන්නන් විසින් "කැටයම්කරුගේ ආයුධයෙන් මුද්‍රා තබන ලද මූර්තියක්; යථාර්ථයේ පිටපතක්" ලෙස පාවිච්චි කරන ලද වචනයකි. වෙනත් වචන වලින්, යේසුස්වහන්සේ පියාණන්ගේ නිශ්චිත පිටපතකි. එනම් යේසුස්වහවන්සේට පියාණන්වහන්සේගේ ස්වභාවය තිබුණි. සරලව කියනවා නම්, යේසුස්වහන්සේ තමන්වහන්සේගේ පියා නොවූසේක. උන්වහන්සේ තමන්වහන්සේගේ පියාණන්ගේ පුත්‍රයාණෝ වූ සේක. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේ නොවේ. උන්වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය. (යොහන් 14:28, 20:17 සසඳන්න.)

අපි යේසුස්වහන්සේ දෙස බැලූ විට, සෑම අංගයන්ගෙන්ම පියාණන්වහන්සේ දකිමු. පියාණන් පුත්‍රයාණන්ට සමානය. උන්වහන්සේගේ පියාණන්ගේ එවැනි එකම එළිදරව්ව යේසුස්වහන්සේ විය. ඔහුගේ සුභාරංචි වාර්තාවේ ප්‍රස්ථාවනාවේ යොහන් මෙසේ පවසයි.

> "කිසිවෙක් කිසිකලෙක දෙවියන්වහන්සේ දුටුවේ නැත. උන්වහන්සේගේ ළයේ ඉන්නාවූ ඒක ජාතක පුත්‍රයාණන් වහන්සේම උන්වහන්සේ ප්‍රකාශ කළ සේක." (යොහන් 1:18)

අප යේසුස්වහන්සේ දෙස සමීපව බැලීමේදී පියාණන් වහන්සේ ගැන අප ඉගෙනගන්නේ කුමක්ද? සුභාරංචි වාර්තා හතර තුළ (මතෙව්, මාර්ක්, ලූක් සහ යොහන්) යේසුස්වහන්සේ තම පියාණන් ගැන කථා කළ වචන අපට ශ්‍රවණය කළ හැක. අපෙග් ස්වර්ගීය පියාණන්ගේ විශිෂ්ට චරිතය ගැන මේවා අපට පවසයි.

තමන්වහන්සේගේ පියාණන් ගැන යේසුස්වහන්සේගේ පාඩම් බොහෝ තැන්වල හමුවන නමුත් ස්ථාන තුනක් විශේෂයෙන්

ප්‍රයෝජනවත්ය. පළමුවැන්න කන්ද උඩ දේශනාවයි. (මතෙව් 5-7 දක්වා පරිච්ඡේද) දෙවැන්න, "දරුවන්" ගැන සුභාරංචි සතර පුරවා ඇති කොටස් මාලාවයි. අවසානයේ යොහන්ගේ පොතේ ඇති ඡේද මාලාවකි.

## (1.) කන්ද උඩ දේශනාවෙන් පාඩම්

1. පියාණන්වහන්සේ තමන්වහන්සේගේ යහපත් නාමය පිළිබඳව සහ තම දරුවන් එය කෙසේ පිළිබිඹු කරන්නේ දැයි සැලකිලිමත් වනසේක.

   **"මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේට ගෞරව කරණ පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියේ ඔබ ලවා" (මතෙව් 5:16)**

2. දෙවියන්වහන්සේ පක්ෂපාතයක් නොපෙන්වන අතර සියල්ල සමාන ලෙස සලකන මෙන් අපගෙන් බලාපොරොත්තු වන සේක.
   **"නමුත් මම නුඹලාට කියමි. නුඹලාගේ සතුරන්ට ප්‍රේමකරපල්ලා, නුඹලාට පීඩාකරන්නන් උදෙසා යාච්ඤා කරපල්ලා, මෙසේ නුඹලා ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේගේ පුත්‍රයෝ වන්නෝය. මක්නිසාද උන්වහන්සේ නපුරන්ටත් යහපතුන්ටත් ඉර උදාකරවන සේක. ධර්මිෂ්ඨයන්ටත් අධර්මිෂ්ඨයන්ටත් වැසි වස්වන සේක." (මතෙව් 5:44-45)**

3. දෙවියන්වහන්සේ සියල්ල දන්නා අතර අපගේ ක්‍රියා අප සඳහා නොව, උන්වහන්සේගේ සේවය සඳහා වේ.

   **"මනුෂ්‍යයන්ට පෙනෙන පිණිස ඔවුන් ඉදිරියෙහිදී නුඹලාගේ ධර්මිෂ්ඨ ක්‍රියා නොකරන්නට බලාගනිල්ලා නැතහොත් ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන් වහන්සේ වෙත නුඹලාට විපාකයක් ඇත්තේ නැත........ නුමුත් නුඹ යාච්ඤා කරන කල්හි නුඹේ ඇතුල් ගෙට වැද, දොර වසා රහසිගතව වසන නුඹේ පියාණන්වහන්සේට යාච්ඤා කරපන්න. එවිට රහසින් දකින නුඹේ පියාණන්වහන්සේ නුඹට විපාක දෙන සේක." (මතෙව් 6:1-6)**

4. අපගේ සියලු අවශ්‍යතා දෙවියන්වහන්සේ සපයන අතර අපගේ ජිවිත උන්වහන්සේගේ සේවය සඳහා කැප කළ හැක.

   **"නුඹලාගේ පියාණන්වහන්සේගෙන් නුඹලා යමක් ඉල්ලන්නට**

පළමුවෙන් නුඹලාට උවමනා දේ කුමක්දැයි උන්වහන්සේ දන්නා සේක............. නමුත් පළමුකොට උන්වහන්සේගේ රාජ්‍යයද උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමද සොයාපල්ලා. මේ සියල්ලන් නුඹලාට දෙනු ලබන්නේය." (මතෙව් 6:8, 32-33)

5. ඒවා අපහට යහපත් නම්, අපගේ ඉල්ලීම් ලබාදීමට උන්වහන්සේට උවමනාය.

"ඉල්ලපල්ලා, එවිට නුඹලාට දෙනු ලැබේ. සොයාපල්ලා, එවිට නුඹලාට සම්බවේ. තට්ටු කරපල්ලා, එවිට නුඹලාට දොර හරිනු ලැබේ. මක්නිසාද ඉල්ලන්නාවූ සියල්ලන්ට ලැබේ. සොයන්නාට සම්බවේ. තට්ටුකරන්නාට දොර හරිනු ලැබේ. නුඹලා අතරෙන් කවර මනුෂ්‍යයෙක් තමාගේ පුත්‍රයා රොටියක් ඉල්ලන්නේ නම් ඔහුට ගලක් දේද? නොහොත් ඔහු මත්සයෙකු ඉල්ලන්නේ නම්, ඔහුට සර්පයෙකු දේද? මෙසේ නපුරු වූ නුඹලා නුඹලාගේ දරුවන්ට යහපත් දේ දෙන්ට දන්නෙහු නම් කොපමණ වැඩියෙන් ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේ තමන්වහන්සේගෙන් ඉල්ලන්නන්ට යහපත් දේ දෙනසේක්ද?" (මතෙව් 7:7-11)

6. දෙවියන්වහන්සේ දයාවන්ත වන අතර අපද දයාවන්ත වීම අපේක්ෂා කරයි.

"නුඹලාගේ පියාණන්වහන්සේ දයාවන්තව සිටින්නාක් මෙන් නුඹලාත් දයාවන්තව සිටපල්ලා" (ලූක් 6:36)

## (2) <u>"දරුවන්" ජේදවලින් පාඩම්</u>

1. අප උන්වහන්සේගේ දරුවන් විය යුතුය. උන්වහන්සේගේ රාජයේ සිටිය යුතු නම් අපි දරුවන් සේ විශ්වාස කළ යුතු වෙමු.

"සැබැවක් නුඹලාට කියමි - යමෙක් දෙවියන් වහන්සේගේ රාජ්‍යය ළදරුවෙකු මෙන් පිළිනොගත හොත් ඔහු කිසිසේත් එහි ඇතුළු නොවන්නේය." (මාර්ක් 10:15)

2. අපගේ පියාණන්ගේ ස්ථානයේ අප අපම නොතැබිය යුතුයි.

"උන්වහන්සේ කුඩා දරුවෙකු තමන් ළඟට කැඳවා ඔවුන් මැද සිටුවා : සැබවක් නුඹලාට කියමි. නුඹලා හැර් කුඩා දරුවන් මෙන් නුනොත් කිසිසේත් ස්වර්ග රාජ්‍යයට ඇතුල් නොවන්නාහුය." (මතෙව් 18:2-3)

## (3) <u>යොහාන්ගේ පොතෙන් පාඩම්</u>

1. කරුණාව සහ සත්‍යය පියාණන්වහන්සේගේ සූචක ගති ලක්ෂණ දෙකකි.

   "තවද වාක්‍යයාණෝ මාංසමත් වී, කරුණාවෙන්ද සත්‍යයෙන්ද පූර්ණව, අප අතරෙහි වාසය කළ සේක. පියාණන්වහන්සේගේ මහිමය වැනි උන්වහන්සේගේ මහිමය දුටුවෙමු" (යොහන් 1:14)

2. දෙවියන්වහන්සේ ප්‍රේමයයි - යේසුස්වහන්සේට සහ උන්වහන්සේගේ සියලු දරුවන්ට ප්‍රේමකරන සේක.

   "ප්‍රේම නොකරන්නා දෙවියන්වහන්සේව නාඳුනයි: මක්නිසාද දෙවියන්වහන්සේ ප්‍රේමයයි." (1 යොහන් 4:8)

   "පියාණන්වහන්සේ පුත්‍රයාණන්ට ප්‍රේම කරන සේක. සියල්ල උන්වහන්සේ අතට භාර දී තිබේ." (යොහන් 3:35)

   "නුඹලා මට ප්‍රේමවූ බැවින්ද මා දෙවියන්වහන්සේ වෙතින් ආ බව විශ්වාස කළ බැවින්ද පියාණන් වහන්සේම නුඹලාට ප්‍රේමවන සේක." (යොහන් 16:27)

3. පියාණන්වහන්සේ ගුරුවරයකු වන සේක.

   " යේසුස්වහන්සේ උත්තර දෙමින් : සැබවක් සැබවක් නුඹලාට කියමි. පියාණන්වන්සේ යමක් කරනවා පුත්‍රයා දකින්නේද ඒදේ මිස තනියම කිසිවක් කරන්ට ඔහුට බැරිය. මක්නිසාද උන්වහන්සේ යමක් කරනසේක්ද පුත්‍රයාත් ඒ දේ එසේම කරන්නේය." (යොහන් 5:19)

   "යේසුස්වහන්සේ ඔවුන්ට කියනසේක් : නුඹලා මනුෂ්‍ය පුත්‍රයා එසවූ කළ, මා ඔහුම බවත්, මාගේම කැමැත්තෙන් මා කිසිවක් නොකර මාගේ පියාණන් වහන්සේ මට ඉගැන්වූ ලෙස මේ දේවල් කියන බවත් නුඹලා දැනගන්නවා ඇත. (8:28)

4. දෙවියන්වහන්සේ අධිකාරිය පවරන සේක.

   "පියාණන්වහන්සේ කවරෙකුවත් විනිශ්චය නොකොට සියලු විනිශ්චය පුත්‍රයාට දී තිබේ............... මක්නිසාද පියාණන්වහන්සේ තමන් තුළම ජීවනය ඇතුව සිටින්නාක් මෙන් පුත්‍රයාටත් තමන් තුළම ජීවනය ඇතුව සිටින්නට උන්වහන්සේ වරය දුන්සේක." (යොහන් 5:23-26)

මෙය සම්පිණ්ඩනය කළ විට, යේසුස්වහන්සේ දෙස බැලීමෙන් දෙවියන්වහන්සේ අපගේ පියාණන් ලෙස බොහෝ දේ අපට ඉගෙන ගත හැක. යේසුස්වහන්සේ පැමිණියේ පියාණන් ප්‍රකාශ කිරීමටය. අප යේසුස්වහන්සේ දෙස බලන විට අප පියාණන් "දකින්නෙමුව". අපගේ ස්වර්ගීය පියාණන් ඉතා සමීප අතර උන්වහන්සේ තමන්වහන්සේගේ දරුවන්ට ප්‍රේමකරන සේක. පවතින්නාවූ ප්‍රේමයකින් උන්වහන්සේ අප රැක බලා සපයා දෙන සේක. ඕනෑම පියෙකු සේ, උන්වහන්සේට අපගේ හැකියාවන් සංවර්ධනය කිරීමට උවමනාය. මෙවැනි පියෙකු සමඟ, අපට ඇති එකම ප්‍රශ්නය නම්: අප උන්වහන්සේගේ දරුවන් වන්නේ කෙසේද?

## අප පියාණන්ගේ දරුවන් වන්නේ කසේද?

බයිබලය පියාණන් ගැන බොහෝ දේ අපට ප්‍රකාශ කළද, එය තවත් මහා බලගතු දෙයක් අපට පෙන්වයි:

> **"නමුත් යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගන්නේද, එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහා ගන්නෝ, ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන්වෙන්ට උන්වහන්සේ බලය දුන් සේක. ඔවුහු ලෙයෙන්වත් මාංසයේ කැමැත්තෙන්වත් මනුෂ්‍යයාගේ කැමැත්තෙන්වත් නොව දෙවියන්වහන්සේගෙන් උපන්නෝය." (යොහන් 1:12-13)**

පියාණන්ගේ දරුවන් වන්නේ කෙසේදැයි අපගේ ප්‍රශ්නයට පිළිතුරු ලෙස අපට බැලිය හැකි ස්ථානය යොහන්ගේ පොතයි. බයිබලයේ වෙන කිසිම පොතකට වඩා දෙවියන්වහන්සේ පියාණන් ලෙස වැඩිම වාරයක් සඳහන් බැවින් යොහන්ගේ පොත "පියාණන්ගේ පොතය" (111 වාරයක් !) වෙනත් අර්ථයකින් එය "දරුවන්ගේ පොත" ද වන්නේය.

යොහන්ගේ සුභාරංචියේ ප්‍රධාන කරුණු මේවාය :

- ✱ දෙවියන්වහන්සේ ස්වර්ගීය පියාණන් වනසේක.
- ✱ යේසුස්වහන්සේ පියාණන්වහන්සේගේ පුත්‍රයාණෝය.
- ✱ යේසුස්වහන්සේ තුළ විශ්වාස කරන්නේනම් අපට උන්වහන්සේගේ දරුවන් වීමට හැකිය.

පියෙකු සතු පැහැදිලි ගති ලක්ෂණය නම් දරුවන් සිටීමය. යොහන්ගේ සුභාරංචිය දෙවියන්වහන්සේගේ <u>පුතුයා</u> ගේ කථාවත්, අනෙකුත් අය හට දෙවියන්වහන්සේගේ දරුවන් වීමට හැකි ක්‍රියාවලියත්, පවසයි.

අප දෙවියන්වහන්සේගේ දරුවන් වන්නේ කෙසේදැයි යේසුස්වහන්සේ සාකච්ජා කරන වැදගත් ස්ථානයක් යොහන් 3 වේ. එදවසේ බොහෝ උගත් යුදෙව් ශාස්ත්‍රවන්තයන්ගෙන් කෙනෙකු වන මහලු මිනිසෙකු වූ නිකදේමුස් සහ යේසුස්වහන්සේ අතර ඇතිවූ කථාබහක් මෙම පරිච්ජේදය වාර්තා කරයි. මෙම කතාබහේදී, දෙවියන්වහන්සේගේ පවුලේ සාමාජිකයෙකු වීම සඳහා අප කළ යුතු දේ යේසුස්වහන්සේ ඉතා පැහැදිලිව දිගු හරියි. මෙම කතා බහට යේසුස්වහන්සේ සහ නිකදේමුස් අතර කෙටි දෙබස් තුනක් ඇතුලත්ය. පැහැදිලි කිරීමට මේවා පහත දැක්වෙන සේ භාවර්තව දක්වා ඇත :

## යොහන් 3 හි පාඩම්

**පළමුවැනි දෙබස (යොහන් 3:2-3)**

නිකදේමුස් : ඔබ ගුරුවරයෙක්. දෙවියන්වහන්සේ ඔබ සමඟයි.

යේසුස්වහන්සේ : ඔබට සැබවින්ම දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වන්නට ඕනෑ නම් ඔබ "ඉහලින්" උපදින්නට ඕනෑය. (මෙම ග්‍රීක වචනය "ඉහලින්" මෙන්ම "නැවත" යන තේරුම්ද දිය හැක.) වෙනත් විධියකින් පවසනවා නම්, දෙවියන් වහන්සේගේ දරුවන් පමණක් උන්වහන්සේගේ රාජ්‍යය උරුම කර ගන්නවා ඇත.

**දෙවැනි දෙබස (යොහන් 3:4-8)**

නිකදේමුස් : මෙය සිදුවන්නේ කෙසේද? දෙවැනි වතාවටත් මිනිසෙකුට "උපදින්නට" හැකිද?

යේසුස්වහන්සේ : "ඉහලින්" නැවත උපදින්නට, ඔබ විශේෂිතවූ ආකාරයකින් බිහිවන්නට ඕනෑය. වතුරෙන් සහ ආත්මයෙන්ය. බෞතිස්මය ලැබූ විට, ඔබ ජලය යටට ගොස් දෙවියන්වහන්සේගේ දරුවෙකු ලෙස මතුවෙයි. ඔබ ජලයෙන් මතුවූ විට, ඔබ නැවත උපත ලදහ. ආත්මික අර්ථයකින්, දෙවියන්වහන්සේගේ දරුවෙකු ලෙසින් ඔබ "හුස්ම" ගනු ලබයි.

තුන්වැනි දෙබස (යොහන් 3:9-12)

නිකදේමුස් : මෙය සිදුවන්නේ කෙසේද?

යේසුස්වහන්සේ : මාගේ වචන සහ ක්‍රියා අද රාත්‍රියෙහි ඔබ මෙහි කැඳවීමට උනන්දු කලාට, ඔබ තවම මා තුළ විශ්වාස නොකරන්නේය. දැන් මා ඔබගේ සිතුවිලි සතපවූ ස්වර්ගීය විෂයයක් දක්වා එසවූවත්: ඔබ තවමත් පැහැදිලිව මා තුළ විශ්වාස කිරීමට සූදානම් නැත. නමුත් පියාණන්ගේ දරුවෙකු වීමට නම් ඔබ විශ්වාස කළ යුතුයි.

නිකදේමුස් ඊශ්‍රායලයේ ගෞරවාදරයට පත්වූ මිනිසකු විය. කෙසේ නමුත් ඔහු යේසුස්වහන්සේ ඉදිරිපිට සිටියේද, සැබවින්ම ඔහුට කිසිවක් නොතිබුණි, මක්නිසාද ඔහු තවමත් සැබෑ පියාණන්ගේ දරුවෙකු නොවී සිටීමයි. ඔහු සතුව මහා ඥාණයක් තිබුනත් ඔහු පූර්ණ ආකාරයකින් විශ්වාස කළේ නැත. ඔහු දෙවියන්වහන්සේගේ පාපය සුව කිරීම මත විශ්වාස තැබුවේ නැත. සියවස් ගණනාවක් තුළ රැස්වූ ව්‍යවස්ථා සමූහයක් මත ඔහු විශ්වාස තැබුවේය.

හදවතට ගත යුතු ඉතා වැදගත් ප්‍රතිපත්තියක් මෙන්න. අපගේ සිතුතුළ දෙවියන්වහන්සේගේ වචනයේ සෑම විස්තරයක්ම අපට තේරුම්ගත හැක. නමුත් අප සැබවින්ම විශ්වාස නොකරන්නේ නම්, අප දෙවියන්වහන්සේට අපගේ ජිවිත සම්පූර්ණයෙන්ම භාරනොදෙන්නේ නම්, අප නිකදේමුස් හා සාමානය - වසර ගණනක අධ්‍යයනයෙන් සිත් පුරවාගෙන යේසුස්වහන්සේ ඉදිරියේ සිටියත්, තවමත් දෙවියන්වහන්සේගේ දරුවෙකු නොවේ. අප කිසිදිනෙක ඥානයත් විශ්වාසයත් පටලවා නොගත යුතුය. ඥානය විශ්වාසයට පූර්වාවශ්‍ය වූවත්, එය එහි ස්ථානය කිසිදිනෙක නොගන්නේය.

මුළු බයිබලයේම "විශ්වාසය" යන්නට හොඳම නිර්වචන වලින් එකක් හිතෝපදේශ පොතේ පද ස්වල්පයක් සපයයි:

"නුඹේම නුවණෙහි නොපිහිටා, නුඹේ මුළු සිතින් ස්වාමීන්වහන්සේ කෙරෙහි විශ්වාස කරපන්න. නුඹේ සියලු මාර්ගවලදී උන්වහන්සේ සලකාපන්න. එවිට උන්වහන්සේ නුඹේ මාවත් සමතලා කරනවා ඇත. නුඹ ඥාණවන්තයෙකැයි සිතා නොගනින්, ස්වාමීන්වහන්සේ කෙරෙහි භයව නපුරෙන් දුරුවෙයන්න. ඒක නුඹේ නහරවලට සනීපයද, නුඹේ ඇටවලට ප්‍රාණවත්කමද වන්නේය." (හිතෝපදේශ 3:5-8)

ස්වාමිවූ යේසුස්වහන්සේ තුළ විශ්වාසය සමඟ පියාණන්ගේ දරුවෙකු වීම ආරම්භ වුවත්, එය එතැනින් කෙළවර නොවන්නේය. බෞතීස්මය ලැබ ඉහළින් සම්පූර්ණ බිහිවීමකට වන අවංක ආශාවට අපගේ විශ්වාසය ඉඩදිය යුතුය.

## යොහන් 3:16 යේ සුභාරංචි සංක්ෂිප්තයක්

පසුව යොහන් 3 පරිච්ඡේදයේ 16 වැනි පදය, අපෝස්තුලුවරයා යේසුස්වහන්සේ නිකදේමුස්ට සහ 21 වැනි සියවසේ තවමත් උන්වහන්සේගේ වදන්වලට සවන් දෙන අය සඳහා උගැන්වූ පාඩම් ඉතා ප්‍රයෝජනවත් සංක්ෂිප්තයක් සපයයි. මෙම සංක්ෂිප්තය, සමහර බයිබල් උගතුන් එය විස්තර කරන පරිදි "කුඩා පරිමාණයේ සුභාංචිය", අප දෙවියන්වහන්සේගේ පවුලට සම්බන්ධ වීමේ ක්‍රියාවලිය ශක්තිමත් කරයි.

"ලෝකයට ප්‍රේමකළ සේක............" සැම සැබෑ පියෙකුගේම චේතනාව ප්‍රේමය වන අතර එය අප ස්වර්ගීය පියාණන් සම්බන්ධවද සත්‍යයකි. උන්වහන්සේ අපගේ සියලු අවශ්‍යතාවයන් අප හට සපයා ඇති සේක. විශාල රැකවරණයකින් සහ ගැඹුරුතම ප්‍රේමයෙන් පෙළඹී උන්වහන්සේ අපගේ විශාලතම අවශ්‍යතාවය සඳහා සපයා ඇත. එනම් මරණයේ දණ්ට කිරීමට සුවයක්ය.

"ස්වකීය එක් ජාතක පුත්‍රයාණන් දෙන තරම්........" ගැළවීම පැමිණෙන්නේ දෙවියන්වහන්සේගෙනි. එය උපයා ගත නොහැකි දීමනාවකි.

"උන්වහන්සේ කෙරෙහි අදහගන්න සැම දෙනම........." ඔබ විශ්වාස නොකරන්නේ නම් ඔබට ඉහළින් බිහිවිය නොහැක. එනම් උන්වහන්සේ පොරොන්දුවූ සියල්ල කිරීමට දෙවියන්වහන්සේට හැකි බැව් ඔබ සම්පූර්ණයෙන්ම ඒත්තුගෙන ඇති නම්, අප නිවැරදි වී ඇත්තේ අපගේ විශ්වාසය, එම විශ්වාසය මතම පමණක් වේ.

"උන්වහන්සේ තුළ අදහාගන්නා ..............." "තුළ" යන වචනය පරිවර්තනය කර ඇත්තේ අලුත් ගිවිසුමේ අනෙක් සැම තැන්හිම වාගේ "ඇතුලත" ලෙස පරිවර්තනය කළ ග්‍රීක වචනයකිනි. එක් පදගත අර්ථ පරිවර්තනයක (The Emphatic Diaglott) මෙම පදය මෙසේ පරිවර්තනය වේ. "ඔහු තුළට විශ්වාසය කරන සැමදෙනාම............." මෙය කුඩා වචනයක් වුවද, එය විශ්වාසය සහ දැනුමේ වෙනස හඟවන ක්‍රියාවලියක වැදගත් පියවරක් විස්තර කරයි.

අප ක්‍රිස්තුස්වහන්සේ දැනගැනීමට පුලුවන, නමුත් උන්වහන්සේ තුළ නොවිය හැක. අප හට නිකදෙමුස්ගේ ශාස්ත්‍රීය දැනුම තිබිය හැක, නමුත් දෙවියන්වහන්සේගේ පුත්‍රයා තුළ අපගේ විශ්වාසයේ සියලු කොටස් නොතැබිය හැක. අපගේ විශ්වාසය අප බෞතිස්මයට යොමුකළ යුතුය. මක්නිසාද, අප ජලයෙන් නුපන්නොත් අපට දෙවියන් වහන්සේගේ රාජ්‍යය බලන්නට නොහැකි බැවිනි.

"විනාශ නොවී.........." ක්‍රිස්තුස්වහන්සේ නොමැතිව පාපයේ දණ්ඩයට සුවයක් නොමැති බැවි අපි පිළිගත යුතුවෙමු.

"සදාකාල ජීවනය ලබන පිණිස..........." පියාණන්ගේ දරුවන් පියාණන්ගේ නිවසෙහි වාසය කරනු ඇත. එය තමන් මිය යැමට ප්‍රථම විස්තරකළ අපෝස්තුලුවර යොහන් දුටු අවසාන මහා දර්ශනය වූ අලුත් යෙරුසලමයි. (එළිදරව් 21:1-4 බලන්න.)

මෙය සම්පිණ්ඩනය කරන්නේ නම්, යොහන්ගේ සභාරංචියේ ප්‍රධාන මූලයන් මේවාය:

යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝය.

දෙවියන්වහන්සේ අපට පියාණන් කෙනෙකු සේ ප්‍රේමකරන සේක.

පාපයට සුවය ලෙස උන්වහන්සේ තමන්වහන්සේගේ පුත්‍රයා සපයා ඇති සේක.

එම සුවය ලැබීමට අපි යේසුස්වහන්සේ තුළට විශ්වාස කළ යුත්තෙමු.

අප ජලයෙන් සහ ආත්මයෙන් බෞතිස්මය තුළ නුපන්නා නම්, අපට දෙවියන්වහන්සේගේ රජ්‍යයට ඇතුළු විය නොහැක.

විශ්වාසකරන්න, බෞතිස්මයෙන් උපදින්න, පියාණන්ගේ දරුවෙකු වන්න.

## අපොස්තුලුවර පාවුල්ගේ ලේඛනවලින් පාඩම්

මෙම පණිවුඩය යොහන්ගේ ලියැවිලි වලට සීමා නොවේ. පාවුල් විසින් ලියන ලද බොහෝ ලිපිවල එය මධ්‍ය තේමාවක් වෙයි. පියාණන්වහන්සේගේ දරුවෙකු වීම ඉතා පෞද්ගලික හේතුවක් නිසා

පාවුල්ට වැදගත් විය. පාවුල් උපන්නේ ටාර්සස්හි සාවුල් ලෙසිනි, ආබ්‍රහම්ගෙන් පැවතෙන්නෙකු සහ ක්‍රියාවෙන් ධර්මිෂ්ඨ වීමේ ධර්මය ආරක්ෂා කළ අයකි. පියාණන්වහන්සේගේ දරුවෙකු වීම සම්පූර්ණයෙන්ම වෙනස් බැව් ඔහු සොයාගත්තේය. එය දෙවියන්වහන්සේගේ පුත්‍රයා තුළ විශ්වාසය මත පාදකවූත් දෙවියන්වහන්සේගේ දයාව මත ගැලවීම පාදකවූත් ජිවිතයක්ය.

"............ඉශ්‍රායෙල්ගෙන් සියල්ලෝම ඉශ්‍රායෙල්වරු නොවෙති. ඔවුන් ආබ්‍රහම්ගේ වංශය නිසාම සියල්ලෝම දරුවෝද නොවෙති. නමුත් වංශයක් ලෙස ගණන්ගනු ලබන්නේ පොරොන්දුවේ දරුවෝය........... ඒ නිසා එය කැමතිවන තැනැත්තාගෙන්වත් දුවන තැනත්තා ගෙන්වත් නොව, දයාවන්නාවූ දෙවියන් වහන්සේගෙන් වේ." (රෝම 9:6-8 , 16)

ගලාති 3 හි, දෙවියන්වහන්සේගේ පවුලට සම්බන්ධ වීමේදී බෞතිස්මයේ වැදගත්කම පාවුල් අවධාරණය කරයි. එතැනදී ඔහු, දෙවියන්වහන්සේගේ දරුවෙකු වීම පෙළපතින් නොව, දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් තුළ විශ්වාසයෙන්ය යන ප්‍රතිපත්තිය අවධාරණය කරයි.

"ආබ්‍රහම් දෙවියන්වහන්සේ විශ්වාස කළේය. එය ඔහුට ධර්මිෂ්ඨකම කොට ගණන්ගනු ලැබුවේය. එබැවින් ඇදහිල්ලෙහි පිහිටන්නෝම ආබ්‍රහම්ගේ පුත්‍රයාණෝ බව දැනගනිල්ලා. තවද දෙවියන්වහන්සේ ඇදහිල්ල කරණකොට ගෙන අන්‍ය ජාතීන් ධර්මිෂ්ඨ කරන බව ලියවිල්ල කල් මත්තෙන් දැක, නුඹ තුළ සියලු ජාතීහු ආශිර්වාද ලබන්නෝය කියා ශුභාරංචිය ආබ්‍රහම්ට කලින් ප්‍රකාශ කළේය. මෙසේ ඇදහිල්ලෙහි පිහිටන්නෝ අදහිල්ලිවන්ත වූ ආබ්‍රහම් සමඟ ආශිර්වාද ලබති." (ගලාති 3:6-9)

"අදහන්නන්ට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇදහිල්ලෙන් වූ පොරොන්දුව දෙනු ලබන පිණිස, ලියවිල්ල සියල්ලන්ම පාපය යට වසා දැමුවේය. නමුත් එළිදරව්වෙන්ට තිබුණ ඇදහීම පිණිස, ඒ අදහීම පැමිණෙන්ට පළමුවෙන්, අපි හිර අඩස්සි වී ව්‍යවස්ථාව යටතේ ආරක්ෂාකරනු ලැබෙවෙමුව. මෙසේ අපි අදහිල්ල කරණකොට ගෙන ධර්මිෂ්ඨකරනු ලබන පිණිස, ව්‍යවස්ථාව අප ක්‍රිස්තුස්වහන්සේ ළඟට පැමිණුවන අපේ ගුරුවරයෙක් වී තිබේ. නමුත් දැන් ඇදහිල්ල පැමිණ තිබෙන බැවින්, අපි තවත් ගුරුවරයෙකු යටතේ නොවෙමුව, මක්නිසාද නුඹලා සියල්ලෝම

ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇදහිල්ල කරණ කොටගෙන දෙවියන්වහන්සේගේ පුත්‍රයෝය. මක්නිසාද නුඹලාගෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළට බෞතිස්ම කරනු ලැබූ සියල්ලෝ ක්‍රිස්තුස්වහන්සේ පැළඳගත්තෝය." (ගලාති 3:22-27)

## අවසානය

බයිබලය, අපගේ ස්වර්ගීය පියාණන් ලෙස දෙවියන් වහන්සේ ප්‍රකාශ වීමත්, උන්වහන්සේගේ දරුවන් වන්නේ කෙසේද කියාත් පෙන්වන කථාවයි. එම ක්‍රියාවලිය සිත් ඇදගන්නා ලෙස සරලය. උන්වහන්සේගේ පුත්‍රයා දෙස බැලීමෙන් සහ උන්වහන්සේට සවන්දීමෙන් පියාණන්වහන්සේ කවුද කියා ඉගෙන ගන්න. උන්වහන්සේගේ පුත්‍රයා තුළ විශ්වාස කරන්න. ඔබගේ ජීවිතය උන්වහන්සේට භාරදෙන්න. යේසුස්වහන්සේගේ නාමයට බෞතිස්ම වී ඉහළින් උපදින්න. යේසුස්වහන්සේ නැවත පැමිණ දෙවියන්වහන්සේගේ පවුල එක්රැස් කරගන්නා තුරු විශ්වාසයෙන් පිරි ජීවිතයක් ගත කරන්න.

- ✱ පියාණන්වහන්සේගේ පුත්‍රයකුවීමෙන් අතිශය ප්‍රබල බලයක් ලැබේ. එය අප කිසිදා සුදුසුවෙන් තැකිය යුතු වරප්‍රසාදයක් නොවේ. පෘථිවිය මත සදාකාල ජීවිතය දෙවියන්වහන්සේ අපට පොරොන්දු වී ඇත.

- ✱ පියාණන්වහන්සේගේ දරුවෙකු වීමට අප ක්‍රිස්තුස්වහන්සේ තුළට විශ්වාස කළ යුතුය. අප උන්වහන්සේ දැන ගත යුතුය. එසේය, නමුත් විශ්වාසය දැනුමට වඩා විශාල දෙයකි. එහි අරුත අපගේ හදවතින්, ආත්මයෙන් සහ මනසින් දෙවියන් වහන්සේ විශ්වාස කිරීමයි. එහි අරුත, සැමදා අප මුහුණ දෙන නිහඬ තීරණ වලදී උන්වහන්සේ විශ්වාස කිරීමයි. අපගේ දැනුම අප ක්‍රියාවට යොමුකළ යුතුය.

- ✱ පියාණන්වහන්සේගේ පුත්‍රයෙකු වීමට, අපගේ විශ්වාසය අප බෞතිස්මයට, දෙවියන්වහන්සේගේ පවුල තුළට බිහිවීම සලකුණු කරන ආශිර්වාදාත්මක ඉසව්ව කරා, යොමු විය යුතුය.

- ✱ පියාණන්වහන්සේගේ දරුවෙකු වීම දයාවේ ප්‍රේමණීය ක්‍රියාවකි. එය උපයා ගැනීමට කළ හැකි කිසිවක් අපට නොමැත. උපදින්නේ රුධිරයෙන්වත් මාංසයේ කැමැත්තෙන් හෝ මිනිසුන්ගේ කැමැත්තෙන්වත් නොව දෙවියන්වහන්සේගේ දයාවෙනි. පාවුල්

සහ නිකදෙමුස්, ධර්මිෂ්ඨතාවය මනුෂ්‍යයන් ලෙස සෙවීමට තම මුළු ජීවිතයම කැපකල අය වූහ. අපද දැනගත යුතුදේ ඔවුහු ඉගෙන ගත්හ. එනම් අපට දෙවියන් වහන්සේගේ පවුල තුළට මාර්ගය උපයා ගත නොහැකි වීමයි. ඒ වෙනුවට අප ක්‍රිස්තුස්වහන්සේ තුළට විශ්වාස කළ යුතු අතර, උන්වහන්සේගේ දයාවෙන් අපට අලුත් හැඳින්වීමක් දෙනු ලබනු ඇත. එනම් පියාණන්වහන්සේගේ දරුවෙක්.

**මාර්ක් බ්‍රැමන්ස්ටොට්**
**කැන්සාස් , මිසූරි**
**ඇමරිකා එක්සත් ජනපදය**

## ප්‍රශ්න

1. පැරණි ගිවිසුමේ දෙවියන්වහන්සේගේ චරිතය එළිදරව් වූයේ කෙසේද? "යහ්වෙහ්" නාමය අදහස් කරන්නේ කුමක්ද? උන්වහන්සේ තමන්, නොයෙක් මාර්ග වලින් කාලයන් තුළ ප්‍රකාශ වීමට තෝරා ගත්තත්, දෙවියන්වහන්සේ එකම බැව් තේරුම් කිරීමට මෙම නාමය උපකාර කරන්නේ කෙසේද?

2. දෙවියන්වහන්සේ ආබ්‍රහම් හට පොරොන්දු කිහිපයක් දුන් සේක. ඒවායින් වඩාත්ම මහත් එක වූයේ කුමක්ද?

3. දෙවියන්වහන්සේගේ පුත්‍රයාවූ යේසුස්වහන්සේගේ උගැන්වීම් වලින්, ක්‍රියාවෙන් සහ චරිතයෙන් අපට උගත හැකි දෙවියන් වහන්සේගේ චරිත ලක්ෂණ මොනවාද?

4. පියාණන්ගේ පුත්‍රයෙකු වීමේදී පළමුවෙනි පියවර කුමක්ද?

5. "ඉහළින් උපදින්නට" යන්න කුමක් අදහස් කරයිද?

6. ඔබ පියාණන්ගේ දරුවෙකු වූයේ නම්, ඔබ ඔබගේ ජීවිතය ගත කළ යුත්තේ කෙසේද?